# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2023/48 - 2017 ජුනි මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2017.06.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15 (1) වැනි වගන්තිය යටතේ නියමය

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 15 (1) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව මහරගම නගර සභාව වෙත පැවරී ඇති ඉඩමක් වශයෙන් මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් වඩා පූර්ණ ලෙස විස්තර කර ඇති ඉඩම අද දින සිට ක්‍රියාත්මක වන පරිදි නාගරික සංවර්ධන අධිකාරිය වෙත මෙම නියෝගය මගින් සතු කරමි.

පාඨලී චම්පික රණවක (පා.ම.),
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2017 ජුනි මස 12 වැනි දින,
17 හා 18 වන මහල්,
''සුහුරු පාය''
බත්තරමුල්ල,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහරගම නගර සභා සීමාව තුළ බලයලත් මිනින්දෝරු බී. යූ. එස්. ප්‍රනාන්දු මහතා විසින් මැන පිළියෙළ කරන ලද අංක 3339 හා 2017 ජනවාරි මස 24 දිනැති මානක සැලැස්මේ කැබලි අක්ෂර A හා B වශයෙන් පෙන්නුම් කෙරෙන උතුරින් අවිස්සාවේල්ල කොළඹ හයිලෙවල් පාර ද, නැගෙනහිරින් මහරගම නගර සභාවට අයත් මෙම ඉඩමේ ඉතිරි බිම් කොටස් ද, දකුණින් මහරගම නගර සභාවට අයත් මෙම ඉඩමේ ඉතිරි බිම් කොටස හා බටහිරින් දෙහිවල පාර ද මායිම් වූ ප්‍රමාණයෙන් (හෙක්ටයාර් 0.40418) හෙක්ටයාර බින්දුවයි දශම හතරයි බින්දුවයි හතරයි එකයි අටක් වූ ඉඩම.

06 - 1105

1A - G 25727 — 08 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*